# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

2025 ජූලි

**මානවශාස්ත්‍ර පීඨය**

**සාහිත්‍ය විචාරය**

(නව නිර්දේශය)

**විසිවන සියවසෙහි සිට විසිඑක්වෙනි සියවස තෙක් අපරදිග සාහිත්‍ය නිර්මාණ සහ විචාර අධ්‍යයනය LTCR 38224**

ප්‍රශ්න 10 න් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නූතනවාදී ඉංග්‍රීසි සාහිත්‍යයෙහි ප්‍රභවයට තුඩු දුන් සමාජ දේශපාලන පරිස්ථිතීය පිළිබඳ විග්‍රහයක් සපයන්න.

02. නූතනවාදී ඉංග්‍රීසි නවකථාවල නිරීක්ෂණය කළ හැකි මුඛ්‍ය ලක්ෂණ කවරේදැයි සනිදර්ශනව පැහැදිලි කරන්න.

03. පශ්චාත් නූතනවාදී සාහිත්‍ය විචාරය හා නූතනවාදී සාහිත්‍ය විචාරය අතර පවත්නා පරස්පර විරෝධී ලක්ෂණ පිළිබඳව සමාලෝචනයක් සපයන්න.

04. පශ්චාත් යටත් විජිතවාදී සාහිත්‍ය විචාරයෙහි මතවාදී පාර්ශවය පෝෂණය කිරීම සඳහා ආසියාතික විද්වතුන් සැපයූ දායකත්වය විමසන්න.

05. භාරතය දෙකඩ වීමෙන් උද්ගත වූ අර්බුදය සමකාලීන ජන ජීවිතය කෙරෙහි බලපෑ ආකාරය අන්තිම දුම්රිය **(The Train to Pakistan)** පරිවර්තිත නවකථාව ආශ්‍රයෙන් විමසන්න.

06. දෛනික ජීවිතයෙහි අංගයක් ලෙස මරණය සාමාන්‍යකරණයෙහි ලා ටී.එස්. එලියට් දක්වන හැකියාව ඔහුගේ මුඩුබිම (The Waste Land) කාව්‍යය ආශ්‍රයෙන් විමසන්න.

07. ටී.එස්. එලියට්ගේ කාව්‍ය නිර්මාණ සිංහල කවිය කෙරෙහි ඇති කළ බලපෑම නිදසුනක් සහිතව පහදන්න.

08. නිකොලොයි ගොගොල්ගේ නිර්මාණවලින් හෙළිවන අධියථාර්ථවාදී ලක්ෂණ පහදන්න.

09. ධනේශ්වර සමාජය තුළ මිනිසා අර්බුදයට ලක් වූ ආකාරය ප්‍රාන්ස් කෆ්කාගේ **Metamorphosis** (රූප විපර්යාසය) කෙටිකතා සංග්‍රහය නිදසුන් ගෙන විමසන්න.

10. කාල්මාක්ස් හා එංගල්ස් හඳුන්වා දෙමින් ඔවුන්ගේ දර්ශනය පිළිබඳ විමසීමක් කරන්න.

******************************